PR/2018/29S

# ජපන් තානාපති කාර්යාලය

නො 20, ශ්‍රීමත් ආර්.ජී.සේනානායක මාවත, කොළඹ 7,  ශ්‍රී ලංකාව
දු.ක :94-11-269-3831~3, ෆැක්ස් 94-11-269-8629
ඊ මේල්: cultujpn@sltnet.lk

2018 සැප්තැම්බර් 29

## <u>පුවත්පත් නිවේදනය</u>

ජපන් සංගීතඥ සුමී කනෙකෝ මහත්මිය විසින් ඉදිරිපත් කල ප්‍රසංගයක් පසු ගිය සැප්තැම්බර් 28 වන දින, කොළඹ විශ්වවිද්‍යාලයේ කළමණාකරණ හා මූල්‍ය පීඨයේ ශ්‍රවණාගාරයේදී පැවැත්විණි. සාම්ප්‍රදායික ජපන් සංගීත භාණ්ඩ වන “කොතෝ” සහ “ශමිසෙන්’ වාද්‍ය විශේෂඥයකු වන කනෙකෝ මහත්මියගේ මෙම ප්‍රසංගය ශ්‍රී ලංකාවේ ජපන් තානාපති කාර්යාලය විසින් ඉදිරිපත් කෙරිණි.

සිය ගණනක් වූ ශ්‍රී ලාංකික රසිකයන් රසවිඳි සාම්ප්‍රදායික ජපන් සංගීතයේ මිහිරෙන් සපිරුණ මෙම ප්‍රසංගයේදී කනෙකෝ මහත්මිය විසින් පණ්ඩිත් අමරදේවයන්ගේ ගීතයක් වන “ශාන්ත මේ රෑ යාමේ” ගයමින් වාදනය කර රසිකයන් අමන්දානන්දයට පත් කළාය.

මීට ඉහතදී ජපන් රජය විසින් කොළඹ විශ්ව විද්‍යාලයේ ශ්‍රීපාලි මණ්ඩපයේ ජනමාධ්‍ය අංශය වෙත එහි ප්‍රයෝගික පුහුණු උපකරණ වැඩිදියුණු කිරීම සඳහා, එම රජයේ සංස්කෘතික අරමුදල යටතේ රුපියල් මිලියන 1.2 ක් වටිනා දායකත්වයක් ලබා දිණි.

ජපානය සහ කොළඹ විශ්වවිද්‍යාලය අතර නව පිටුවක් සනිටුහන් කිරීමට මෙම ප්‍රසංගය සමත් විය.

************************************************************
වැඩි විස්තර සදහා සංස්කෘතික අංශය අමතන්න
දු.ක :94-11-269-3831~3 ( දිගුව- 227)